# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 53 — 1973 මාර්තු 30 වැනි සිකුරාදා — 1973.03.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... | 61 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | 62 | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |


සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 12 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 13 දරන ගම්බද අධිකරණ (සංශෝධන) පනත 1973 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

**වෙළඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.**

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වාද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වාද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වාද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වාද, භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

**ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.**

### ආශ්‍රිත කිරීම්

**මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.**

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

**රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.**

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## විරෝධය දැක්වීම

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග වී.ඇම්. 7 දරණ පෝර්ම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේ දී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැලකිල්ලට ගනු ලැබේ.**

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,225. (2) ලැබුණ දිනය : 1970 දෙසැම්බර් මස 9 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : සුමිටෝමෝ කෙමිකල් කො. ලිමිටඩ් (ජපානයේ නීති යටතේ විධිමත්ව සංවිධානය වූ සමාගමකි), අංක 15, 5-චෝම්, කීටහාමා, හිගාෂි-කු ඔසාකා, ජපානය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : මුරුගේසු සහ කුලරත්න මහතුන්, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ. (5) පන්තිය : 1. (6) බඩු : නිෂ්පාදනයන්හි ඡායාරූප ශිල්පයෙහි හෝ දර්ශන විද්‍යාත්මක පයෙෂීෂණයන්හි භාවිතා වන රසායන ද්‍රව්‍ය සහ මල නිවාරක. (7) වෙළඳ ලකුණේ සටහන :

**SUMINITE**

මෙම වෙළඳ ලකුණ අංක 21,993 හා 33,962 දරණ වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබුවහොත් හෝ ලැබූවිට එම ලකුණ හා ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 ජූනි මස 14 දින.

3-1234/1—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,583. (2) ලැබුණ දිනය : 1971 මැයි මස 31 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ඩියර් ඇන්ඩ් කම්පනි (ඩිලවෙයාර් රාජ්‍යයේ සංයුක්ත මණ්ඩලයකි) මොලයින්හි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි, ඉලිනොයිස්, ඇමරිකා එක්සත් ජනපදය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : වී. මුරුගේසු මයා., කුලරත්න සහ මුරුගේසු මහතුන්, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1. (5) පන්තිය : 6. (6) බඩු : කෘෂිකාර්මික සහ උද්‍යාන කාර්මික වැඩ කටයුතුවල භාවිතා කෙරෙන යන්ත්‍ර සහ ඒවායේ 7 වන පංතියේ අඩංගු කොටස් හැර සියලුම වර්ගවල යන්ත්‍ර උපකරණ සහ ඒවායේ කොටස්. (7) වෙළඳ ලකුණේ සටහන :



මෙම වෙළඳ ලකුණ අංක 32,429 දරණ වෙළඳ ලකුණ හා ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 ජූනි මස 16 දින.

3-1234/2—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,962. (2) ලැබුණ දිනය : 1971 ඔක්තෝබර් මස 28 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : සුමිටෝමෝ කෙමිකල් කො. ලිමිටඩ් (ජපානයේ නීති යටතේ විධිමත්ව සංවිධානය වූ සමාගමකි), අංක 15, 5-චෝම් කීටහාමා, හිගාෂිකු, ඔසාකා ජපානය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : වී. මුරුගේසු මයා., මුරුගේසු සහ කුලරත්න මහතුන්, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1. (5) පන්තිය : 1. (6) බඩු : නිෂ්පාදනයන්හි ඡායාරූප ශිල්පයෙහි හෝ දර්ශන විද්‍යාත්මක පර්යේෂණයන්හි භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන :

**SUMIFIX**

මෙම වෙළඳ ලකුණ අංක 21,993 හා 32,225 දරණ වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබුවහොත් හෝ ලැබූවිට එම ලකුණු හා ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 ජූනි මස 14 දින.

3-1234/3—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

**ශුද්ධියකි**

අංක 40 හා 1972 දෙසැම්බර් මස 29 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 25,968 හා 1964 ජූලි මස 27 දින වෙළඳ ලකුණ සම්බන්ධ සිංහල නිවේදනයේ පළවී ඇති 2 වන අංකය (ලැබුණ දිනය) පහත සඳහන් අයුරු නිදොස් විය යුතුය.
අංක 2 (ලැබුණ දිනය) : 1964 ජූලි මස 27 දින.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1972 පෙබරවාරි මස 21 දින.

3-1113—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**ශුද්ධියකි**

අංක 36 හා 1972 දෙසැම්බර් මස 1 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 31,530 හා 1969 ජූනි මස 5 දින වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ අංක (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) පහත සඳහන් අයුරින් නිදොස් විය යුතුය.

අංක (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ඇමරිකන් හෝම් ප්‍රොඩක්ට්ස් කෝපරේෂන් (ඩිලවෙයාර් රාජ්‍යයේ සංයුක්ත මණ්ඩලයකි), අංක 685, තෙවන මාවත, නිව්යෝර්ක්, නිව්යෝර්ක්, 10017 ඇමරිකා එක්සත් ජනපදය ; නිෂ්පාදකයෝ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1973 පෙබරවාරි මස 26 දින.

3-1112—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

**ශුද්ධියකි**

අංක 15,011 හා 1972 මැයි මස 19 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 32,834 හා 1968 දෙසැම්බර් මස 30 දිනැති වෙළඳ ලකුණ සම්බන්ධ සිංහල නිවේදනයේ අංක (2) (ලැබුණ දිනය) පහත සඳහන් අයුරින් නිදොස් විය යුතුය:—

අංක (2) ලැබුණ දිනය: 1968 දෙසැම්බර් මස 30 දින.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1973 පෙබරවාරි මස 24 දින.

3–1111—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| මාර්තු | ... | **73.03.02** සිකුරාද | ... | 73.02.23 සිකුරාද | දවල් 12.00 |
| | | **73.03.09** සිකුරාද | ... | 73.03.02 සිකුරාද | දවල් 12.00 |
| | | **73.03.16** සිකුරාද | ... | 73.03.09 සිකුරාද | දවල් 12.00 |
| | | **73.03.23** සිකුරාද | ... | 73.03.16 සිකුරාද | දවල් 12.00 |
| | | **73.03.30** සිකුරාද | ... | 73.03.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | **73.04.06** සිකුරාද | ... | 73 03.30 සිකුරාද | දවල් 12.00 |
| | | **73.04.11** බදාද | ... | 73.04.06 සිකුරාද | දවල් 12.00 |
| | | **73.04.19** බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | | **73.04.27** සිකුරාද | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.